www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සර්කෝසිගේ කප්පාදු කිරීම්වලට එරෙහිව පොදු අධ්‍යාපනය ආරක්ෂා කරනු යුරෝපීය සහ ජාත්‍යන්තර කම්කරුවන්ගේ සහ තරුනයන්ගේ එකමුතුව ගොඩනගනු

## Defend public education against Sarkozy's cuts! Unite workers and youth across Europe and internationally!

**සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ ව්‍යාපාරයේ ප්‍රකාශය**
**2008 මැයි 14**

*මැයි 15 ප්‍රන්සය පුරා පැවැත්වෙන විරෝධතා පෙලපාලිවල දී සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ පහත ප්‍රකාශය බෙදා හරිනු ඇත. ආන්ඩුවේ අධ්‍යාපන කප්පාදුවලට එරෙහිව ගුරුවරුන්ගේ හා ශිෂ්‍යයන්ගේ සමිති එක්දින වර්ජනයක් කැඳවා තිබේ.*

මැයි 15 වන දා පැවැත්වෙන ගුරුවරුන්ගේ හා උසස් පාසල් ශිෂ්‍යයන්ගේ එක් දින වර්ජනය ජනාධිපති සර්කෝසිගේ අධ්‍යාපන කප්පාදුවට එරෙහිව දෙමසක් පුරා පැවැත්වෙන පෙලපාලි හා විරෝධතාවල ඉදිරියට ගෙන යාමකි. ශිෂ්‍යයන්ට හා ගුරුවරුන්ට එරෙහි ප්‍රහාරය, රාජ්‍ය අංශයේ කම්කරුවන්, විශ්‍රාමිකයන්, සංක්‍රමිකයන්, හා ලේඛනගත නොවූ කම්කරුවන් ඇතුලු සමස්ත කම්කරු පන්තියට ම එල්ල කෙරෙන ප්‍රහාරයක කොටසකි.

.කම්කරු පන්තියට එරෙහි මෙම ප්‍රහාරය සරලව ම ප්‍රන්සයට සීමා වූ ප්‍රශ්නයක් නොවේ. එය යුරෝපීය පරිමාන සහ ජාත්‍යන්තර ප්‍රශ්නයකි. පාසැල් පුද්ගලීකරනය කිරීමට සහ ධනවතුන්ගේ දරුවන් සඳහා ගුනාත්මක අධ්‍යාපනයක් සහ සෙසු සියලු දෙනාට ම පහල ප්‍රමිතියෙන් යුත් ද්විත්ව අධ්‍යාපන ක්‍රමයක් දෙසට මූල්‍ය ප්‍රභූන් යොමු වීම නිසා එක්සත් ජනපදයේ මෙන්ම යුරෝපය පුරා රජයේ පාසැල් අරමුදල් හිඟයකට මුහුන දී ඇත.

පාසල් අධ්‍යාපනය අවසන් වූ පසු කම්කරු පන්තික තරුනයින්ට මුහුනදීමට සිදුවන්නේ කුමකට ද? විරැකියාව හෝ අඩුවැටුප් සහිත රැකියා සහ යුද්ධයට ඇද දමා ඉන් මිය යෑමේත් තත්වයට ය.

තරුන ජනයාට එරෙහි ප්‍රහාරය පිටුපස පවතින ගාමක බලය වන්නේ ධනවාදී පද්ධතියේ වෛෂයික අර්බුදය මිස හුදෙක් එක ජනාධිපති වරයෙකුගේ හෝ එක ආන්ඩුවක ප්‍රතිපත්තීන් පිලිබඳ කාරනාවක් නොවේ. මුදුනත සිටිනා සියයට එක පොහොසත් කිරීමේ පදනම මත වත්කම් ඉහල දැමීම මගින් පුම්බනු ලැබූ ලෝක ආර්ථිකය මූල්‍ය පද්ධතිය මෑත දිය වී යාමට ආසන්න වීමත් සමග යලි වතාවක් ආර්ථික අවපාතයක තර්ජනයට මුහුන දී ඇත.

ධනවාදී පද්ධතියේ අසමර්ථභාවය, වැටුප් කප්පාදුව හා කම්කරුවන්ගේ ශ්‍රමයෙන් වැඩි ලාභ මිරිකාගැනීම, සියලු සමාජ වැඩසටහන් කප්පාදු කිරීම සහ ඉරාකය, ඇෆ්ගනිස්ථානය මෙන් යටත්විජිත මාදිලියේ වැදගත් සම්පත්, වෙලඳපොල හා ලාභ ශ්‍රම සම්පත් අල්ලා ගැනීම සඳහා වූ පාලක පන්තීන්ගේ යුද ධාවනය පමනක් වේගවත් කරයි.

ඇෆ්ගනිස්ථානය තුල ප්‍රන්සයේ හා අනෙකුත් යුරෝපා සංගමයේ හමුදා සේනාංක විශාල ප්‍රමානයක් යොදවනු ලැබ සිටිති. ඉරාකය තුල මිලිටරි වාඩිලා ගැනීමට ප්‍රන්ස ආන්ඩුවත්, බොරු "විරෝධයක්" මවාපාන සමාජවාදී පක්ෂයත් විරුද්ධ නොවේ. ඉරානයට එරෙහි තර්ජනයට ඔවුන් දෙගොල්ලම සහයෝගය දෙති.

ගිනිය නොහැකි වු ජනතාවකට ආහාර වැනි අතිමූලික අවශ්‍යතාවන් පවා සැපයීම වලකනු ලැබ තිබේ. ආහාර සමපේක්ෂනයේ හා ලාභ උලුප්පා ගැනීම කුපිත කිරීම මගින් ආහාර මිල ගනන් දැඩි ලෙස ඉහල යෑම බිලියන සංඛ්‍යාත ජනතාවමත කුසගින්න සහ මිලියන ගනන් ජනයා සාගතයට ඇදදැමීමේ තර්ජනයට මුහුන දෙමින් සිටිති.

අප්‍රේල් මාසයේ නිවේදනය කල යුරෝ බිලියන 7 ක සර්කෝසිගේ අයවැය කප්පාදුව ආරම්භය පමනි. ධනවාදය තමන් පිලිබඳව සැලකිලිමත් වනතාක්දුරට 20 වන සියවස ආරම්භයෙන් මෙහා නොදුටු පරිමානයෙන් කම්කරු පන්තියේ ජීවන මට්ටම් කාබාසිනය කර දැමිය යුතුව තිබේ.

සර්කෝසි ආන්ඩුව වගේ ධනපති ආන්ඩුවලට පහලින් පීඩනය යෙදීම මගින්, ධනවාදයේ ජාත්‍යන්තර අර්බුදය

මගින් මතු කරන ප්‍රශ්න විසඳනු ලැබිය නොහැකිය. සමාජය තුල මූලික වෙනස්කම් කිරීමට කැපවූ ක්‍රියාමාර්ගයක් සහ සර්කෝසිගේ ආන්ඩුව හෙලා ඔහුව කම්කරු ආන්ඩුවකින් විස්ථාපනය කිරීමෙන් පමනක් ආමන්ත්‍රනය කලහැකි විප්ලවවාදී ගැටලු එමගින් ඉස්මතු කෙරෙයි.

අවශ්‍යව පවතින්නේ, සමාජ සමානතාවය, අධිරාජ්‍යවාදී යුද්ධය අවසන් කිරීම සහ ප්‍රජාතන්ත්‍ර අයිතීන් මුලුමනින්ම තහවුරු කිරීම සඳහා සටන් කරන එනම් සමාජවාදය සඳහා සටන් කරන කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීමයි. හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේත් එහි දෛනික අන්තර්ජාල ප්‍රකාශය වන *ලෝක සමාජවාදී වෙබ් අඩවියේත්* තරුන අංශය වන සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ සටන් වදින ඉදිරිදර්ශනය මෙයයි.

පසුගිය දසවසර පුරා වර්ජන සහ විරෝධතාවලින් අඩුවක් නොවීය. 1968 මැයි-ජුනි වර්ජන ව්‍යාපාරයෙන් පසුව 1995 දී විශාලතම වර්ජනය දක්නට ලැබුනි. රාජ්‍ය අංශයේ සේවකයන්ගේ විශ්‍රාමික වැටුප් ආරක්ෂා කිරීමේ සහ ජාතික අධ්‍යාපන සේවය විනාශ කිරීමට එරෙහිව 2003 දී මහජන ව්‍යාපාරයක් පැන නැගුනි. "ප්‍රතිගාමී සමාන අවස්ථා නීතිය"ට විරුද්ධව මාසයක් පුරා පැවති වර්ජන සහ පෙලපාලි දක්නට ලැබුනි.

එහෙත් වෘත්තීය සමිති නායකත්වය සහ නිල වමේ පක්ෂ වන සමාජවාදී පක්ෂය හා කොමියුනිස්ට් පක්ෂය - විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය හා ලුට්ටේ උවුරියේ වැනි ඊනියා "වඩාත් දෘඩතර වම්මුන්ගේ" උදව්වෙන් - මේ අරගල පීලිපන්නා අවසානයේ දී පවා දුන්නාහ. ඔවුහු ආන්ඩුව බිඳ දැමීම ප්‍රතික්ෂේප කරමින් ඒ වෙනුවට මහජන ව්‍යාපාරය ඊට (ආන්ඩුවට) බලපෑම් දැමීමට සීමා විය යුතු යැයි අවධාරනය කලහ.

මිලියන සංඛ්‍යාත කම්කරුවන් හා තරුනයන් සහභාගි වූ මෙම අරගලයන්ගේ ප්‍රතිපලය ලෙස දෙවන ලෝක යුද්ධයෙන් පසු බලයට පත් වූ වඩාත්ම දක්ෂිනාංශික ආන්ඩුව බලයට ගෙනැවිත් ඇත. ඇයි ? මක්නිසාදයත්, මෙම අරගලයන් මෙහෙයවනු ලැබුවේ සාවද්‍ය ඉදිරිදර්ශනයක් මතය; එනම්, මහජන පීඩනය මගින් පාලක පන්තියේ පිලිවෙත් සැලකිය යුතු ආකාරයකට වෙනස් කල හැකි වෙතැයි යන මිථ්‍යාවය.

වත්මන් අරගලය තුලදීත්, එෆ්අයිඩීඑල් (උසස් පාසල් ශිෂ්‍යන්ගේ ස්වාධීන ප්‍රජාතන්ත්‍රවාදී බලමන්ඩලය) හා යූඑන්එල් (උසස් පාසැල් ශිෂ්‍යන්ගේ ජාතික සංගමය) යන උසස් පාසැල් ශිෂ්‍ය සමිතිවල ඉදිරිදර්ශනය වන්නේ, මහජන පීඩනය මගින් සර්කෝසිගේ අධ්‍යාපන කප්පාදුව වැලැක්විය හැකිය බවත්, ඔහුගේ පරිපාලනයට කම්කරුවන්ගේ හා තරුනයන්ගේ අවශ්‍යතාවයන් වෙනුවෙන් ක්‍රියාකිරීමට බලකල හැකි බවත් ය. එහෙත්, නරකම පහල කුසලතා පෙන්නුම් කරන උසස් පාසල් 200කට පුහුනු ගුරුවරුන් වෙනුවට අධ්‍යාපන ඇමති සේවියර් ඩාකොස් ලබා දී ඇත්තේ අඩු ගෙවීම් සහිත නුපුහුනු ගුරු සහායකයින් 1500 ක් පමනය. ගුරු තනතුරු 11,200 ක් කප්පාදු කිරීමට ඔහු පසුබට වූයේ නැත.

කම්කරු පන්තියේ අතිමූලික අවශ්‍යතාවන් පවා වෘත්තීය සමිති විසින් තව දුරටත් ආරක්ෂා නොකරනු ඇත. තරගකාරිත්වය සහ ලාබය ඉහල දැමීම සඳහා කම්කරුවන් මත කොන්දේසි පැටවීමට ඔවුහු සංගත හිමියන් සමග වැඩ කරති. සීජීටී (පොදු කම්කරු සම්මේලනය) සහ එහි නායක බර්මාඩ් තයිබෝල්ට් එලිපිටම සර්කෝසි සමග සහයෝගිව සිටියි. නමුත් ඊනියා "වම" හා "අන්ත වමේ" පක්ෂ කම්කරුවන් මේ බංකොලොත් සංවිධානවලට බැඳ තැබීමට වැඩ කරති.

සමස්තයක් ලෙස තරුනයන්ගේ හා කම්කරුවන්ගේ අයිතීන් හා ජීවන තත්වයන් ආරක්ෂා කරගැනීමේ පූර්ව කොන්දේසිය වන්නේ, ධනවාදය පෙරලා දමා සමාජවාදී සමාජයක් ස්ථාපිත කිරීමේ අරගලය වටා යුරෝපය පුරාත්, ජාත්‍යන්තරවත් තරුනයන් සහ වැඩකරන ජනතාව බලමුලු ගැන්වීමේ නව ඉදිරිදර්ශනයක් මත පදනම් වූ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීමය.

සමාජයේ සමාජවාදී පරිවර්තනයක අර්ථය වන්නේ, ග්‍රහලෝකයේ සම්පත් පොදු අයිතියට හා ප්‍රජාතන්ත්‍රීය පාලනය යටතට ගැනීම මගින් මූල්‍ය කතිපයාධිකාරීත්වයේ අව්‍යශතා සඳහා නොව මහජන අවශ්‍යතා සන්තර්පනය කිරීමට යොදා ගැනීමට හැකි වීමය.

මෙම ඉදිරිදර්ශනය සඳහා සටන් කිරීමට කම්කරු පන්තියේ නව විප්ලවවාදී නායකත්වයක් ගොඩනැගිය යුතු ය. එම අරගලයට සම්බන්ධ වී එය ඉදිරියට ගෙන යන ලෙස සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ කැඳවුමු කර සිටී.

© www.wsws.org